# බංගලාවේ අභිරහස



පියුමංසි උමායා මාපාබණ්ඩාර

# බංගලාවේ අභිරහස

**පියුමංසි උමායා මාපාබණ්ඩාර**

**කතෘ**

**කතෘගේ වෙනත් කෘති.**

- ❖ පැණි පුහුල් ගෙඩිය
- ❖ මගේ පුංචි තුන් ඉරිඅප්පු
- ❖ අපූරු යාලුවෝ
- ❖ උමාගේ කොටි පැටියා
- ❖ මායා මැණික සොයාගත් වික්‍රමය

මහා/මහාමායා බාලිකා විදුහල
5 ශ්‍රේණිය A
2025/02/08

**IS37219**

# පිදුම

දිවා රෑ වෙහෙසී මගේ අනාගතය වෙනුවෙන් ඇප කැප වන

මගේ ආදරණීය අම්මාට, අප්පච්චීට, සහ මා පුංචි කාලයේ සිට

රැක බලාගත් කිරිඅම්මාට, කිරිඅත්තාට සහ මෙම පොත

ලිවීමට උනන්දු කර වූ අපේ ආදරණීය සමන්මලී ගුරු මෑණියන්ටත්

ප්‍රාථමික අංශයේ පන්තිභාරව සිටි අමිතා ගුරු මෑණියන් ඇතුළු සියලුම මෑණිවරුන්ටත්, පියවරුන්ට

සහ මගේ

පංතියේ සියලු ම මිතුරියන්ට පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේදනිසාය. එසේ නම්මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියත් ගොඩනඟා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමන් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්තදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රටතුල යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් තුල යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ඇති කරන්නට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය

ශෂිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර


"අශේන් යමුද කැලෑවට?" මලිදු, කසුන්, විහඟ ඒ ඇසුවේ තම පාපැදි අශේන්ගේ නිවස ඉදිරිපිට නතර කරගෙනය. "ම්..... ඉන්න මම අම්මට කියලා එන්නම්." එසේ පවසා නිවස තුළට දිව ගියේය. අශේන් සහ ඔහුගේ මිතුරන් වයස අවුරුදු එකොළහක කපිරිම් ළමුන් විය. මෙවර පාසල් නිවාඩුවට කුමක් හෝ විශේෂ දෙයක් කිරීමට ඔවුන් බලාපොරොත්තු වූහ. "අම්මා මම කැලේට යනවා." අශේන් අම්මාගෙන්ද අවසර ගෙන පැමිණ තම පාපැදිය පාරට දැම්මේය.



මිතුරන් සතර දෙනා කැලෑව ඇතුලට යන අතරතුර කසුන් තම හඩ අවදි කළේය. "මේ යාළුවනේ අපේ සීයා කිව්වා මෙහෙ පරණ බංගලාවක් තියෙනවලු. හැබැයි ඒක පරණ උනාට ඒකේ ජීවත් වෙන්න පුළුවන්. මේ ළඟදි දවසක ඔය බංගලාව සල්ලි වලට ගන්න කොළඹ පැත්තෙ මහත්තයෙක් ආවලු. ඒ මහත්තයා බංගලාව ඇතුලට යනකොට ම හොඳට ම බයවෙලා කලන්තේ දාලා. ඊට පස්සේ ආයෙ ඒ මහත්තයා අපේ ගම පැත්තෙවත් ඇවිත් නැහැ. කසුන් විස්තර කිරීම අවසන් කළේය. අසා සිටි අනෙක් තිදෙනා පැවසුවේ එම බංගලාවේ වාසය කළ අයගේ ආත්මය සිටිය හැකි බවයි. සිවු මිතුරන් කතා කරමින් කැලෑව තුළට ගියහ. "මේ ඒක නෙවෙයි, ඔය කියන බංගලාව බාරව ඉන්නේ කවුද?"

අශේන් ඇසුවේය."ම්..... මම නම් හරියට ම දන්නෙ නෑ ඒ කවුද කියලා .ඇයි එහෙම ඇහුවේ." කසුන් ටිකක් කුතුහලයෙන් ඇසුවේය. "නෑ නිකම්..... අපි දවසක යමු ඔය බංගලාව බලන්න. යාලුවෝ හෙට දින එම බංගලාවට යාමයට කතිකා කර ගත්තෝය. සවස හතර පමණ වන තෙක් වනය මැද රැඳී සිට නැවතත් ඔවුහු නිවෙස් බලා ගියහ.

තම සහෝදරයා නිවසට පැමිණෙන තෙක් බලා සිටින කුඩා නැගණිය අශේන්ට සිහියට නැගුණි. එම නිසා ඔහු කඩපිලට ගොස් සීනි බෝල මිලදීගෙන අවසාන නැවතුම ලෙස නිවස බලා ගියේය. තම අයියා ගෙන ආ සීනි බෝල කෑ නැගෙණිය ප්‍රීතිවූවාය.



පසු දින උදෑසනම සිවු මිතුරු කල්ලිය බංගලාව බලා පිටත් විය. වනාන්තරය ඇතුළත තිබූ මේ බංගලාව කළු ගලින් කර වූ ක්‍රිස්තියානි බංගලාවකි. බංගලාවේ ඉදිරිපස මහලෙහි මුදුනෙහි කුරුසයක් මත ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ රූපයක් දර්ශනය විය. වටපිටාවේ විශාල රුස්ස පයිනස් ගස් ගොම්මන මෙන්ම, බකුසන්ගේ භයංකාර හඬ ඕනෑම නිර්භීත පුද්ගලයෙකුගේ සිතට වුවත් තැතිගැනීමක්,පාළුවක් ඇති කරවයි. මිතුරන් සිව් දෙනා බංගලාවට ඇතුළු වීමට ඇති විශාල ගේට්ටුව අසල ඇති පයිනස් ගස් කිහිපයක් අසල තමපාපැදි නතර කළෝය. තම සිත්වල ඇතිවී ඇති කුතුහලය සහ බිය මිශ්‍ර වූ අමුතු හැඟීමත් සමගම බංගලාවෙ ගේට්ටුව නැවතී ම කෙටි වේලාවක් බංගලාවෙන් පිටතට පෙනෙන කුරුසිය දෙස බලා සිටියහ. "ඔය ළමයි මොකද මෙතන කරන්නේ? යනවලා ගෙවල් වලට" මහලු කටහඬක් ඇසුණු හෙයින් තිගැස්සී පිටුපස බැලුව පිරිමි ළමුන් දුටුවේ උස කෙසඟ සිරුරක් හෙබි මහල්ලෙකි. ඔහු උපැස් යුවලක්ද පැළඳ සිටියේය. කලිසමක් සහ බැනියමක් පමණක් ඇඳ සිටි හෙතෙම දකින ඕනෑම කෙනෙකුට සිතෙන්නේ ඔහු බොහෝ නපුරු මිනිසකු ලෙසටයි.


"සුභ උදෑසනක් මහත්මයා. මම කසුන්. මේ මගේ යාළුවො තුන්දෙනා. අපට මේ බංගලාව පොඩ්ඩක් බලන්න පුළුවන්ද?" කසුන් ආයාචනාත්මකව මහල්ලාගෙන් විමසුවේය. කොහෙත්ම ඒක කරන්න බෑ. ඔය ළමයි කරුණාකරලා ගෙවල් වලට ගියොත් හොඳයි. නැත්නම් මම හොඳ පාඩමක් උගන්නනවා. මහල්ලා ඉතා ක්‍රෝධයෙන් බෙරිහන් දුන්නේය. ළමුන් මහල්ලාගේ වචනයට කීකරු වී නැවතත් පිටත් විය. නමුත් මොවුන් නිවෙස් බලා ගියේ නැත. දොළ පහර අසල රැඳී සිටිමින් මේ බංගලාවේ අභිරහස සම්බන්ධව සාකච්ඡා කළෝය. මට පේන විදිහට මේ බංගලාව ගැන අර වයසක මනුස්සයා මොනවා හරි හංගනවා. අපි කොහොමහරි මේක හොයාගන්න ඕන. කසුන් තව ඔය බංගලාව ගැන සීයගෙන් විස්තර අහලා දැනගන්න. එතකොට අපිට මේක තව ගොඩක් ලේසි වෙයි. විහඟ කියූ දේට කසුන් එකඟහ විය. හෙට දින අලුත් තොරතුරු දැනගැනීමේ බලාපොරොත්තුවෙන් යහළුවන් සතර දෙනා තම නිවෙස් බලා ගියහ.

පසු දින උදෑසන කසුන් නිවෙසින් පිටත් වීමේ බලාපොරොත්තුවෙන් මිදුලට පැමිණිය නමුත්, නිවසට ඥාතීන් පිරිසක් පැමිණෙන බව කියූ නිසා කසුන් තම මිතුරන්ටද එම පණිවිඩය මෙලෙස දැන්වූයේය. "යහළුවනි, අද දින උදෑසන කාලයේ අපගේ නිවසට අමුත්තන් පිරිසක් පැමිණෙන බැවින්, අපගේ මෙහෙයුම් කටයුතු දහවල් කාලයට කල් දැමීමට සිදුව තිබෙනවා. පත් වූ අපහසුතාවයට සමාවන්න." පණිවිඩය ලැබුණු යහළුවන් තිදෙනා එයට එකඟ වූහ. එදින දහවල් කාලයේ කැලෑවේ දොළ අසලට එක් රොක් වූ මිතුරු කණ්ඩායම නව තොරතුරු පිළිබඳ සාකච්ඡා කළහ. "මට සීයා කිව්වා ඔය බංගලාවේ ගොඩක් වටින නිධානයක් තියෙනවලු. මම හිතන විදිහට ඔය නිධානය තමයි මිනිස්සුන්ව බය කරන්න මුල් වෙන්නේ." කසුන් තම සීයා කියූ විස්තර යහළුවන්ට පැවසීය. "හ්ම්..... ඒක තමයි හේතුව. අශේන් කල්පනාකාරී ලෙස පැවසුවේය. කෙටි වේලාවක නිහඬියාවකට පසු යමක් මතකයට පැමිණි හෙයින්, නිහඬියාව බිඳ දැමුවේය. "තව දෙයක් බංගලාවට යන්න, අපි එදා ගිය පාර නැතුව වෙන කෙටි මාර්ගයක් තියෙනවලු. අපි අද ඒ පාරේ යමු."

කසුන් තම කතාව අවසන් කළේය. තම තමන්ගේ අදහස් ඉදිරිපත් කිරීමෙන් පසු බංගලාවට යාමට ඇති අලුත් මාර්ගයේ යාමට පිටත් වූහ. එම කෙටි මාර්ගය බොහෝ කාලයකින් භාවිතා නොකළ බව ඔවුන්ගේ ගමනේ කටුක භාවයෙන් පැහැදිලි විය. පුරුදු මාර්ගයට වඩා බංගලාවට යාමට වේලාවක් ගත විය. ගමනේ අවසානයේ බංගලාවේ පිටුපස කුඩා කුටියක් අසල විය. ළඟ තිබූ පඳුරක් පිටුපස සැඟවුණු මිතුරන් සිව් දෙනා මුරකරු සහ තවත් පුද්ගලයෙක් සිටිනවා දුටුවහ. එම පුද්ගලයින් දෙදෙනා කුමක්දෝ ලිපියක් පිළිබඳ සාකච්ඡා කරමින් සිටියෝය. මිතුරන් සිව් දෙනා මෙම සාකච්ඡාව ඉතා සාවධානයෙන් අසා සිටියහ. "සිරිපාල හෙට ඔයා මුරට එන්න ඕනේ නැහැ. හැබැයි බංගලාවේ දොර වහන්නත් එපා. හෙට රෑට මම ඇවිත් ඔය නිධානයගන්නවා. ඒකෙන් බාගයක් ඔයාට ලැබෙනවා. තේරුනානේ."එසේ පැවසූ මිනිසා මුරකරුගෙන් සමුගත්තේය. ඉන්පසු මුරකරු ඉතා කපටි සිනහවක් මුව රඳවාගෙන ගේට්ටුව ඇසළට ගියේය. "හරි අපි හිතුවා හරියට ම හරි. නිධානය ගන්න ඕන නිසා

තමයි බංගලාව මිලට ගන්න එන මිනිසුන්ව බය කරන්නේ."

පඳුර පිටුපස සැඟවී සිටින ළමයින්ගෙන් විහඟ එසේ පැවසුවේය. අන් අයද එයට එකඟ විය. නැවතත් තම තමන්ගේ පාපැදි ද රැගෙන දොළ අසලට මොවුන් පැමිණියහ. දොළ අසල ඇති සුන්දරත්වයත් ගතට දැනෙන සියුම් සිසිලසත් නිසා මෙම මිතුරු කල්ලිය දොළ සමග ඇති අවට පරිසරයට බොහෝ සේ ඇලුම් කළහ. තම කල්ලියෙහි සිදු කරන  වික්‍රමයන් සාර්ථක වීමට මේ නිදහස් දැකුම්කලු පරිසරය  බෙහෙවින් ඉවහල් විය. එම නිසා සියලුම සාකච්ඡා දොළ අසල සිදු කිරීම සියුමිතුරු කල්ලියේ සිරිතකි. නගරබද පරිසරයේ දරු දැරියන්ට ලබාගත නොහැකි අත්දැකීම් රාශියක් සිවුමිතුරු කල්ලිය වනය, වනසතුන් ඇළ දොළ,……… ආදියෙන් ලබා ගනිති. දොළ අසලට පැමිණ විනාඩි කිහිපයක් දුෂ්කර ගමනේ විඩාව නිවා ගැනීමෙන් පසු, සිවුමිතුරු කල්ලිය සාකච්ඡාව ආරම්භ කළහ. "මේ අහන්නකෝ යාළුවනේ, අපි හෙට දවල් බංගලාවට යමු. ගිහින් අර කපටි හොරුන්ට කලින් නිධානය අරන් පොලිසියට බාර දෙමු.



සීයා කිව්වා ඔය නිධානයට සිතියමක් නැහැ කියලා. ඒක ගන්න තියෙන්නේ හොඳට හිතල බලලා කල්පනා කරලාලු. ඒ නිසා අපට කොහෙත්ම ඒක කරන්න පුළුවන්. මතකයිනේ සිතියමක් තිබ්බ අභිරහසක් වුණත්, අපි ඒ සිතියම් නැතුව විසඳුවා. ඒ නිසා මේක අපිට මහ ලොකු දෙයක් නොවෙයි. මලිඳු තම යාළුවන්ගේ මතකයන් පසුගිය නිවාඩු කාලයට රැගෙන ගියේය. "ඔව් මලිඳු අනිවාර්යයෙන්ම. අපිට මේක විසඳන්න පුළුවන්. හෙට කොහොම හරි කරලා මේ අභිරහස් අපි ඉවරයක් කරමු." සිවුමිතුරන් කල්ලිය ඉතා දැඩි අධිෂ්ඨානයකින් යුතුව හෙට දින වෙනදාටත් වඩා

උදෑසනින් පැමිණීමට එකඟ වී තම තමන්ගේ නිවෙස් බලා ගමන් ඇරඹූහ.

රාත්‍රී කාලය පුරාවට පසු දිනයේ කුමක් සිදුවේ දැයි යන කුතුහලයත් සමඟම සිය මිතුරු කල්ලිය වේලාසනින්ම නින්දට ගියහ.

උදෑසන හය වන විට සිවුමිතුරු කල්ලිය දොළ අසලට පැමිණියහ. උදෑසන මිහිඳුමත් පින්නත් සම ගතට දැනෙන හිරිගඩු පිපෙන සීතල හේතුවෙන් සියලු දෙනා සීතල කබා පැළඳ සිටියහ. පෙරදිග ආකාසයේ රන් පැහැයෙන් නැගෙන හිරු අවට පරිසරය වචනයෙන් කිව නොහැකි තරම් මනරම් කළේය. හිමිදිරි නැවුම් බවත් සමඟ සිවු මිතුරන් තම වික්‍රමය ආරම්භ කළහ. කෙටි මාර්ගය මඟහැර සුපුරුදු මාර්ගයේ තම තමන්ගේ පාපැදි හැරවීය. පෙර දිනයේ මුරකරුට අර පුද්ගලයා පැවසූ පරිදි ගේට්ටුව මෙන්ම බංගලාවේ දොරද විවෘතව කර තිබිණ. පාපැදි පෙර දිනක නතර කළ පයිනස් ගස් අතරේම නතර කළේය. "ඇතුලට යමු. කසුන් ඔයා එළියේ ඉඳන් කවුරු හරි එනවද කියලා බලන්න." අශේන් එහෙම කියලා. යාළුවො දෙන්නත් සමග බංගලාව ඇතුලට ගියේය. වටපිට බල බල යන විට

බිත්තියේ එල්ලා තිබූ පින්තූරයක් වැදිලා දොරක් ඇරුණා. "මේක වෙන්න ඕන නිධන් කාමරය." මලිඳු පැවසුවේය. ඒත් එක්කම පිරිමි ළමයි දෙදෙනාගේ කමිස වලින් අල්ලනවා දැනිලා ගැස්සිලා බැලුවා. එවිට ඔවුන් පිටුපස මහළු මුරකරු සිටියේය. පිටුපසට හැරුණු විහඟ මහල්ලාගේ අත සැපුවේය. මහල්ලා කෑ ගසමින් බිම හිඳ ගනිමින් පිරිමි ළමුන්ට ශාප කරන්නට විය. මෙම හඬ ඇසුණු පසු කසුන්ට වී ඇත්තේ කුමක්ද යැයි වැටහිණි. කසුන් වහා ගොස් ඔහුගේ පියත් සමග පොලිස් නිලධාරීන්ද කැටුව පැමිණියේය. ඒ වන විට අනෙක් පුද්ගලයාද පැමිණ සිටියේය. පොලිස් නිලධාරින් රහස් කාමරය පරීක්ෂා කිරීමෙන් අනතුරුව හොරබඩු පෙට්ටි වගයක්ද සොයාගත්හ. කෙසේ හෝ අවසානයේ පිරිමි ළමුන් සිව් දෙනා ඔවුන්ගේ පළාතේ වීරවරු විය.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මකක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍යය කෙතේ ලේඛක රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන්වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ.

සම්බන්ධීකාරක.

සෙනවිරත්න මහලේකම්.

**IS37218**